ISSN 1391-4022
අගෝස්තු -2008

# ගෘහඒකක ආදායම් හා වියදම් පිළිබඳ සමීක්ෂණය - 2006/07
## සංක්ෂිප්ත වාර්තාව
### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවාසී ජනතාවගේ ආදායම, වියදම, දරිද්‍රතාවය, පරිභෝජනය, භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ හැකියාව ආදී කරුණු පිළිබඳව තොරතුරු ලබාගැනීමේ අරමුණින් ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයක් සෑම වසර 5 කට වරක් බැගින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබේ. 2006/07 වර්ෂවලදී පවත්වනු ලැබූ සමීක්ෂණය මෙම සමීක්ෂණ මාලාවේ 6 වැන්න වේ. මෙවර සමීක්ෂණයේදී දරිද්‍රතාවය පිළිබඳව වැඩිදුරටත් තොරතුරු ලබාගැනීමට හැකිවනසේ සමීක්ෂණ උපලේඛණය විශේෂයෙන් පිළියෙල කරන ලදී.

ජනතාවගේ ආදායම්, වියදම් හා පාරිභෝජන රටාවේ කාලීන වෙනස්කම් ඇති බැවින් මෙවැනි සමීක්ෂණයක් සාමාන්‍යයෙන් අඛණ්ඩව මාස 12 ක කාලයක් තුල පවත්වනු ලැබේ. මෙම සමීක්ෂණයේදී දත්ත රැස්කිරීම 2006 ජූලි සිට 2007 ජුනි දක්වා පවත්වන ලදී. සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සමීක්ෂණය දිවයින පුරා පැවත්වීමට කටයුතු යොද තිබුණ නමුත් උතුරු පළාතේ සියලුම දිස්ත්‍රික්ක වල සහ නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සමීක්ෂණ කටයුතු පැවත්වීමට නොහැකිවිය. මේ අනුව අනෙකුත් දිසත්‍රික්ක වල සමීක්ෂණ කටයුතු සම්පූර්ණ කරණ ලද ගෘහ ඒකක සංඛ්‍යාව 18,544 ක් වේ.

## 2. ගෘහඒකක ආදායම

මුදල් භාණ්ඩ හා සේවා මගින් ගෘහඒකකයේ සියළුම සමාජිකයින්ට ලැබුන සම්පූර්ණ ආදායම ගෘහ ඒකකයේ ආදායම වශයෙන් සමීක්ෂණයේදී සලකා ඇත.

මෙම සමීක්ෂණ ප්‍රතිඵල අනුව ගෘහඒකකයක මාසික මධ්‍යන ආදායම රු. 26,286 ක් වේ. 2002 සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව එම ආදායම රු. 12,803 ක් වශයෙන් වාර්තාවී ඇති බැවින්, වසර 5 ක කාලයක් තුලදී ගෘහ ඒකකයක මාසික මධ්‍යන ආදායම දල වශයෙන් දෙගුණයකින් වැඩිවී ඇති බව පෙනීයයි.

කෙසේනමුත් ගෘහඒකක අඩු ප්‍රමාණයක් වෙත ලැබුන ඉහළ ආදායම් අගයන් නිසා මධ්‍යන ගෘහඒකක ආදායමට බලපෑමක් ඇතිවිය හැකිය.

එමනිසා මධ්‍යස්ථ ආදායම ගෘහඒකක ආදායම සඳහා වඩා සුදුසු මිනුමකි. 2006/07 සමීක්ෂණය අනුව මාසික ගෘහඒකක මධ්‍යස්ථ ආදායම රු. 16,735 ක් වේ. මේ අනුව ශ්‍රී ලාංකික ගෘහඒකක සංඛ්‍යාවෙන් 50% ක ගෘහඒකක වල මාසික ආදායම රු. 16,735 ට වඩා අඩුබව සඳහන් කල හැකිය.

දිස්ත්‍රික් මට්ටමින් මාසික ගෘහඒකක ආදායමේ මධ්‍යස්ථ අගය පරීක්ෂා කිරීමේදී කොළඹ දිස්ත්‍රික්කයේ ගෘහඒකක ආදායමේ මධ්‍යස්ථ අගය රු. 24,711 ක් වන අතර එය සෙසු දිස්ත්‍රික්ක වලට වඩා වැඩිම අගය ලෙස වාර්තාවී ඇත. ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල මාසික ගෘහඒකක මධ්‍යස්ථ ආදායම් අගය පිළිවලින් රු. 20,564 ක් සහ රු. 18,500 ක් වශයෙන් වර්තාවී ඇත. මාසික ගෘහඒකක ආදායමේ අඩුම මධ්‍යස්ථ අගය වන රු. 11,914 ක් වාර්තාවන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙනි.

**වගු අංක 1**
**මාසික ගෘහ ඒකක ආදායමේ මධ්‍යස්ථ හා මධ්‍යනය අගයන්**

| දිස්ත්‍රික්ක | මධ්‍යස්ථය රු. | මධ්‍යනය රු. |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 16735 | 26286 |
| කොළඹ | 24711 | 42825 |
| ගම්පහ | 20564 | 29038 |
| කළුතර | 18500 | 27721 |
| මහනුවර | 16203 | 24444 |
| මාතලේ | 14119 | 19678 |
| නුවරඑළිය | 11914 | 25621 |
| ගාල්ල | 17517 | 24907 |
| මාතර | 16229 | 22914 |
| හම්බන්තොට | 16784 | 24076 |
| මඩකලපුව | 15593 | 21032 |
| අම්පාර | 14556 | 20676 |
| කුරුණෑගල | 14500 | 22870 |
| පුත්තලම | 15612 | 21939 |
| අනුරාධපුර | 16133 | 21995 |
| පොළොන්නරුව | 15913 | 30530 |
| බදුල්ල | 14804 | 22035 |
| මොණරාගල | 12320 | 20118 |
| රත්නපුර | 14356 | 22741 |
| කෑගල්ල | 13114 | 18062 |




### 3. ඒක පුද්ගල ආදායම

යම්කිසි ප්‍රදේශයක සියළුම ගෘහස්ථක වලට ලැබුන සම්පූර්ණ ආදායම එම ප්‍රදේශයේ ඇස්තමේන්තුගත සම්පූර්ණ ජනගහනයෙන් බෙදීමෙන් ඒකපුද්ගල ආදායම මෙහිදී ගණනය කර ඇත.

මෙම සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල මධ්‍යන ආදායම රු. 6,463 ක් වේ. දිස්ත්‍රික් මට්ටමින් ඒකපුද්ගල මධ්‍යන ආදායම සැසඳීමේදී වැඩිම ඒකපුද්ගල ආදායම (රු. 10,165 ) කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇත.

කොළඹ දිස්ත්‍රික්කයේ ඒකපුද්ගල මධ්‍යස්ථ ආදායම රු. 5,750 වශයෙන් වාර්තාවී ඇත. එය දිස්ත්‍රික් මට්ටමින් ඉහලම මධ්‍යස්ථ ඒකපුද්ගල ආදායම ලෙස සැලකිය හැකිය. අඩුම මධ්‍යස්ථ ඒක පුද්ගල ආදායම ( රු. 2,902 ) නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇත.

### 4. ආදායම් උපයන්නන්ගේ ආදායම

මෙම සමීක්ෂණයේදී ආදායම් උපයන්නන් වශයෙන් සලකා ඇත්තේ පහත කරුණු සම්පූර්ණ වූ පුද්ගලයින්ය.

1) වයස අවුරුදු 10 හෝ වැඩි සහ
2) මාසික ආදායම රු 150 හෝ වැඩි

සමීක්ෂණ ප්‍රතිඵල අනුව ශ්‍රී ලාංකික ආදායම් උපයන්නන්ගේ මාසික ආදායමේ මධ්‍යන අගය රු. 14,457 ක් වේ. දිස්ත්‍රික් මට්ටමින් සැසඳීමේදී කොළඹ දිස්ත්‍රික්කයේ ආදායම් උපයන්නන් ගේ මාසික ආදායමේ මධ්‍යන අගය රු. 21,355 ක් වේ. මෙය දිස්ත්‍රික් මට්ටමින් වැඩිම අගය වේ.

කෑගල්ල දිස්ත්‍රික්කයේ ආදායම් උපයන්නන්ගේ මාසික ආදායමේ මධ්‍යන අගය රු. 9,761 කි. මෙය දිස්ත්‍රික් මට්ටමින් පහලම අගය වේ.

**වගු අංක 2**
**ඒකපුද්ගල මාසික ආදායම සහ උපයන්නන්ගේ මාසික ආදායම**

| දිස්ත්‍රික්කය | ඒකපුද්ගල මාසික ආදායම | | ආදායම් උපයන්නන්ගේ මධ්‍යනය ආදායම (මාසික) |
|---|---|---|---|
| | මධ්‍යනය රු. | මධ්‍යස්ථය රු. | රු. |
| ශ්‍රී ලංකාව | 6463 | 4043 | 14457 |
| කොළඹ | 10165 | 5750 | 21355 |
| ගම්පහ | 7065 | 4836 | 14825 |
| කළුතර | 6650 | 4213 | 14220 |
| මහනුවර | 5928 | 3679 | 14005 |
| මාතලේ | 5069 | 3681 | 11112 |
| නුවරඑළිය | 6281 | 2902 | 13685 |
| ගාල්ල | 6068 | 4217 | 13528 |
| මාතර | 5475 | 3819 | 11943 |
| හම්බන්තොට | 5789 | 4114 | 13474 |
| මඩකළපුව | 5211 | 3765 | 13641 |
| අම්පාර | 4754 | 3400 | 13387 |
| කුරුණෑගල | 5960 | 3723 | 12957 |
| පුත්තලම | 5436 | 3731 | 13107 |
| අනුරාධපුර | 5913 | 4405 | 13662 |
| පොළොන්නරුව | 7943 | 4074 | 18763 |
| බදුල්ල | 5428 | 3425 | 12781 |
| මොණරාගල | 4837 | 3087 | 12756 |
| රත්නපුර | 5626 | 3499 | 12627 |
| කෑගල්ල | 4527 | 3432 | 9761 |

### 5. ගෘහස්ථක වියදම

සමීක්ෂණයේදී ගෘහස්ථක වලින් වියදම පිළිබඳව තොරතුරු ලබාගැනීම පහසු කරලීම සඳහා පහත සඳහන් කාණ්ඩ යටතේ එම වියදම් තොරතුරු රැස්කර ඇත.

(i) ආහාර සඳහා වියදම්

(ii) ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වියදම්

(iii) ගෘහස්ථකයේ සිටිය හැකි නේවාසික සහ ගෘහ සේවකයන් විසින් දරණ ලද වියදම්

නිරවද්‍ය හා ගුණාත්මක දත්තයන් ලබාගැනීම තවදුරටත් පහසුකරලීම සඳහා උපක්‍රමික වශයෙන් ආහාර ද්‍රව්‍ය සඳහා සතියක වියදමද ආහාර නොවන ද්‍රව්‍ය සඳහා මාසික වියදමද, ඇඳුම් රෙදිපිළි සහ කල්පවතින වෙනත් භාණ්ඩ ආදිය සඳහා මාස 6 ක වියදමද වශයෙන් තොරතුරු රැස්කරන ලදී.

සමීක්ෂණය අනුව ශ්‍රී ලංකාවේ ගෘහඒකක මධ්‍යනය මාසික වියදම රු. 22,952 ක් වේ. මෙම වියදමින් ආහාර ද්‍රව්‍ය සඳහා පමණක් වූ වියදම රු. 8,641 ක් වේ. එහෙයින් ආහාර වියදම් අනුපාතය 37.6% ක් වේ.

**වගු අංක 3**
**මාසික ගෘහඒකක මධ්‍යනය වියදම**

| දිස්ත්‍රික්කය | මධ්‍යන ගෘහඒකක වියදම රු. | ගෘහ ඒකකයක මධ්‍යනය පුද්ගල සංඛ්‍යාව |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 22952 | 4.1 |
| කොළඹ | 37011 | 4.2 |
| ගම්පහ | 29145 | 4.1 |
| කළුතර | 24911 | 4.2 |
| මහනුවර | 21762 | 4.1 |
| මාතලේ | 19067 | 3.9 |
| නුවරඑළිය | 14220 | 4.1 |
| ගාල්ල | 23079 | 4.1 |
| මාතර | 21348 | 4.2 |
| හම්බන්තොට | 20568 | 4.2 |
| මඩකළපුව | 21592 | 4.0 |
| අම්පාර | 22311 | 4.3 |
| කුරුණෑගල | 18453 | 3.8 |
| පුත්තලම | 21332 | 4.0 |
| අනුරාධපුර | 20290 | 3.7 |
| පොළොන්නරුව | 21202 | 3.8 |
| බදුල්ල | 17334 | 4.1 |
| මොණරාගල | 13155 | 4.2 |
| රත්නපුර | 16423 | 4.0 |
| කෑගල්ල | 15773 | 4.0 |

ගෘහඒකක වියදම දිස්ත්‍රික් මට්ටමින් සැසඳීමේදී කොළඹ දිස්ත්‍රික්කයේ මධ්‍යන මාසික ගෘහඒකක වියදම රු. 37,011 වශයෙන් වාර්තාවේ. එය දිස්ත්‍රික් මට්ටමින් උපරිම මාසික ගෘහඒකක වියදමවේ. අවම මාසික ගෘහඒකක වියදම රු. 13,155 ක් මොණරාගල දිස්ත්‍රික්කයෙන් වාර්තාවේ.

## 6. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පාරිභෝජනය

සමීක්ෂණ ප්‍රතිඵල අනුව ඒක පුද්ගල මාසික සහල් පරිභෝජනය කි. ග්‍රෑ. 90 ක් වේ. මේ අනුව ඒකපුද්ගල වාර්ෂික සහල් අවශ්‍යතාව කි. ග්‍රෑ. 108 ක් පමණ වේ.

නාගරික දිස්ත්‍රික්කවල ඒක පුද්ගල පාන් පරිභෝජනය සෙසු දිස්ත්‍රික්ක වලට වඩා වැඩි බවද සමීක්ෂණ තොරතුරු අනුව පෙනීයයි. දිස්ත්‍රික් මට්ටමින් කිරිගුපිටි සඳහා වැඩිම ඒකපුද්ගල පරිභෝජනය මාසිකව කි. ග්‍රෑ. 3.7 ක් නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත

**වගු අංක 4**
**ගෘහඒකක මාසික ආහාර පාරිභෝජනය**

| දිස්ත්‍රික්ක | සහල් කි. ග්‍රෑ. | කිරිගු පිටි කි. ග්‍රෑ. | පාන් කි. ග්‍රෑ. |
|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 9.0 | 0.6 | 1.5 |
| කොළඹ | 6.6 | 0.2 | 2.5 |
| ගම්පහ | 7.5 | 0.3 | 2.2 |
| කළුතර | 8.5 | 0.2 | 2.1 |
| මහනුවර | 8.6 | 1.1 | 1.4 |
| මාතලේ | 9.3 | 0.8 | 1.1 |
| නුවරඑළිය | 9.6 | 3.7 | 1.0 |
| ගාල්ල | 8.7 | 0.3 | 2.2 |
| මාතර | 9.8 | 0.1 | 1.4 |
| හම්බන්තොට | 11.5 | 0.1 | 0.8 |
| මඩකළපුව | 8.7 | 0.3 | 1.6 |
| අම්පාර | 10.0 | 0.3 | 1.0 |
| කුරුණෑගල | 9.8 | 0.3 | 1.0 |
| පුත්තලම | 8.5 | 0.6 | 1.7 |
| අනුරාධපුර | 10.1 | 0.5 | 1.0 |
| පොළොන්නරුව | 11.0 | 0.4 | 0.8 |
| බදුල්ල | 10.8 | 1.3 | 0.8 |
| මොණරාගල | 11.8 | 0.3 | 0.5 |
| රත්නපුර | 11.0 | 0.6 | 1.0 |
| කෑගල්ල | 8.8 | 0.6 | 1.2 |

## 7. ආහාර නොවන ද්‍රව්‍ය සඳහා ගෘහඒකකවල මාසික වියදම

ආහාර නොවන ද්‍රව්‍ය සඳහා ගෘහඒකක වල මාසික මධ්‍යනය වියදම රු. 14,311 ක් වේ. මෙම වියදමින් ගෘහඒකක වලට වැඩිම ප්‍රමාණයක් වැයවන්නේ නිවාස කුලී, වරිපනම් බදු, සහ ජලය සඳහාය. එම වියදම රු. 2,639 වශයෙන් වාර්තා වී ඇත.

නිවාස වියදම ඇතුලු අනිකුත් ප්‍රධාන වියදම්, ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වූ මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස වගු අංක 6 හි සඳහන් කර ඇත.

වගු අංක 5

**ආහාර නොවන ද්‍රව්‍ය සඳහා ගෘහඒකකවල මාසික මධ්‍යනය වියදම**

| වියදම් කාණ්ඩය | මධ්‍යනය ගෘහඒකක වියදම රු. |
|---|---|
| මුළු වියදම | 14311 |
| නිවාස | 2639 |
| ඉන්ධන හා ආලෝකය | 1042 |
| සෞඛ්‍ය | 980 |
| ප්‍රවාහන | 1862 |
| පණිවුඩ හුවමාරු | 539 |
| අධ්‍යාපන | 632 |
| සංස්කෘතික හා විනෝද කටයුතු | 260 |
| කල්තබාගත නොහැකි ද්‍රව්‍ය | 301 |
| ඇඳුම් හා රෙදිපිළි | 694 |
| දිගුකල් පවතින භාණ්ඩ | 786 |
| වෙනත් විවිධ වියදම් | 2292 |
| මත්පැන් හා මත්ද්‍රව්‍ය | 492 |
| වෙනත් අහඹු වියදම් | 1791 |

වගු අංක 6

**ප්‍රධාන කොටස් වල වියදම ආහාර නොවන ද්‍රව්‍යවල මුළු වියදමේ ප්‍රතිශතයක් වශයෙන්**

| වියදම් කාණ්ඩය | ප්‍රතිශත වියදම % |
|---|---|
| නිවාස | 18.4 |
| ප්‍රවාහන | 13.0 |
| ඉන්ධන හා ආලෝකය | 7.2 |
| සෞඛ්‍ය | 6.8 |
| දිගුකල් පවතින භාණ්ඩ | 5.4 |
| ඇඳුම් හා රෙදිපිළි | 4.8 |
| අධ්‍යාපන | 4.4 |
| පණිවුඩ හුවමාරු | 3.7 |
| මත්පැන් හා මත්ද්‍රව්‍ය | 3.4 |
| කල්තබාගත නොහැකි ද්‍රව්‍ය | 2.1 |
| සංස්කෘතික හා විනෝද කටයුතු | 1.8 |
| වෙනත් විවිධ වියදම් | 16.0 |
| අහඹු වියදම් | 12.5 |

**8. ජීවන තත්වය**

සමීක්ෂණයේදී ලබාගත් නිවාස පිළිබඳ අනිකුත් තොරතුරු.

වගු අංක 7

| කාණ්ඩය | ගෘහ ඒකක ප්‍රතිශතය % |
|---|---|
| නිවාස ආලෝක කිරීම් | |
| ප්‍රධාන විදුලිය | 79.9 |
| භූමිතෙල් | 17.8 |
| වෙනත් | 2.3 |
| දුරකථන පහසුකම් | |
| ස්ථිර රැහැන් සහිත දුරකථන ඇති ගෘහඒකක | 16.4 |
| ජංගම දුරකථන පමණක් ඇති ගෘහඒකක | 15.3 |
| ඉහත වර්ග දෙකම වාර්තාවී ඇති ගෘහඒකක | 14.8 |
| දුරකථන පහසුකම් නැති ගෘහඒකක | 53.5 |
| පානීය ජලය | |
| ආරක්ෂිත ජලය ලැබීම | 85.0 |
| අනාරක්ෂිත ජලය ලැබීම | 15.0 |
| ආහාර පිසීම සඳහා යොදගන්නා ප්‍රධාන ද්‍රව්‍ය | |
| දර පමණක් භාවිතය | 79.5 |
| ගෑස් භාවිතය | 17.1 |
| භූමිතෙල් | 2.4 |
| වෙනත් | 1.0 |
| වැසිකිළි පහසුකම් | |
| තම නිවස සඳහා පමණක් වෙන්වූ | 89.1 |
| වෙනත් නිවසක් සමග පොදුවේ භාවිතා කරන | 7.3 |
| වැසිකිළි භාවිතා නොකරන | 3.6 |
| භාවිත වැසිකිළිවල වර්ගය | |
| ජලමුද්‍රිත | 76.6 |
| සෝද හරින | 14.1 |
| වල | 5.5 |
| වෙනත් | 3.8 |

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 15/12 , මේට්ලන්ඩ් චන්ද්‍රවංකය, කොළඹ 7.**
දු.ක.: 2695291, ෆැක්ස්: 2697594, ඊමේල් ලිපිනය: dgcensus@sltnet.lk

වෙබ් අඩවිය :www.statistics.gov.lk